Page 11 May 2012.qxd 10/05/2012 10:18 Page 1



## මුහුණ නොපෙනීම

මහාචාර්යවරයෙක් තම වෛද්‍ය ශිෂ්‍යයෙකුගේ අවසාන පරීක්ෂණයේ දී මෙසේ ඇසී ය.

" ශල්‍යකර්මවලදී ශල්‍යවෛද්‍යවරුන් මුහුණු ආවරණ පළඳින්නේ ඇයි? "

"ඔපරේෂන් එකේදී කිසියම් දෝෂයක් ඇතිවුනොත් ඒක සිදුකළ කෙනාව අඳුරගන්න බැරිවෙන්න," ශිෂ්‍යයා පිළිතුරු දුන්නේ ය.

## මෙහෙමත් කේක්

බේකරියකින් කේක් ගෙඩියක් ගෙන ගිය කාන්තාවක් එය රැගෙන නැවත බේකරියට ආවා ය.

" මුදලාලි මේ කේක්එක හරිනෑ නේ "

" නෝනා අපිට එහෙම චෝදනා කරන්න එපා. අපි කේක් හදන්නේ අවුරුදු 88 කට කලින් ඉඳලයි. "

" හැදුවට කමක් නෑ, ඒවා දැන් විකුණන එකනේ හොඳ නැත්තේ. "

**Double bed room to rent.**

10 minute walk to Burnt Oak Tube station. There is a wash basin in the bedroom itself, reasonable use of washing machine, internet and all bills inclusive. **£ 120 per week**. Kitchen and bath room to share with the landlord. No other tenants. Parking for a car on the drive away. **Ideal for 2 students or a couple.**
15 minute bus ride to Middlesex University.
Current tenants leaving on 5th June.
**Call 07944 393018 any time.**

**Domestic Part P & BS7671 Qualified**
**Professional Electrical Engineer**
**All electrical work carried out**
**Testing-Inspecting and Certification of all work**
**All jobs undertaken with guarentee**
**NICEIC Certificate**
ගෘහස්ත සියළු විදුලි කාර්මික කටයුතු සඳහා
ප්‍රවීන විදුලි ඉන්ජිනේරු ශිල්පී සේවය
**Call - රන්ජිත් Ranjith on 07846764560**

**ලිහිණියා LIHINIYA**

ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල
*ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ*
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
*උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.*
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
*ලිහිණියා විශේෂ නිශ්පාදනයක් වන*
**බැදපු සහ අමු තුනපහ දැන් ඉතා ජනප්‍රියයි**

**Tel. 0208 450 9052**
**66 Cricklewood Broadway, London NW2 3EP**

**වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි**

**සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ**

♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 448270 / 432236

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

**සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ. දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.**

**TRICO**
**Shipping & Forwarding Ltd**

**555 White Hart Lane**
**London N17 7RP**
**Telephone 0208 888 8787**
**Fax 0208 889 5445**
**E-Mail : trico@tricoshipping.com**
*නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය*



## බෝට්ටු පැදීම

අංගොඩ මානසික රෝහලේ මානසික රෝගීන් එළිමහනේ ඇවිදිමින් හා නොයෙක් විකෘති දේ කරමින් සිටින අතර වෛද්‍යවරු හා උපස්ථායකයෝ ඔවුන් ගැන හොඳ සෙවිල්ලෙන් සිටිති. එක් රෝගියෙක් තණ බිස්සක වාඩිවී වරින්වර ඉදිරි පසට හා පසුපසට නැමෙමින් අතදෙක අඹරවමින් බෝට්ටු වක් හබල්ගාන සෙයක් පෙන්නුම් කළේය.

එතැනින් ගිය වෛද්‍යවරයෙක් මදක් නැවතී " මොනවද උන්නැහේ ඔහේ කරන්නේ.....? " යි ඇසීය.

" මම මේ මීගමු කලපුවේ බෝට්ටුවක් පදිනවා......" රෝගියා කීවේය. " දැන් මං ඉන්නෙ කළපුව මැද්දෙ......"

" කෝ ඔතන බෝට්ටුවක් නැහැනේ...." දොස්තර මහතා කීය.

" හැබැව තමයි..." කළබලයෙන් කී රෝගියා " අනේ මට පීනන්නත් බෑ... අයියෝ මාව බේරගන්න කවුරුවත් නැද්දෝ...." කියමින් කෑගසන්නට විය.

## අසනීපෙ හැටි

*මිනිහෙක් වෛද්‍යවරයා හමුවී තමාට වැළඳී ඇති ලෙඩේ විස්තර කළේය.*

***රෝගියා:*** දොස්තර මහත්තෙයෝ මගේ ලෙඩේ තමයි හොරකම් කරන එක.. මම ගෙවල් ගණනාවක් බිඳලා තියෙනවා.... සාප්පුවකට ගියාම මොකක් හරි බඩුවක් උස්සන්න හිතෙනවා.... මහ කැත ලෙඩක්......

***දොස්තර :*** (බෙහෙත් තුණ්ඩුවක් ලියා අතට දෙමින්) මෙන්න මේ බෙහෙත ගත්තම ඔක හරියාවි.....

***රෝගියා:*** මේවට හරි නොගියොත් ඉතිං මොකද කරන්නේ.....?

***දොස්තර:*** එහෙම වුනොත් ඊළඟ සැරේ එනකොට මට සෝනි විඩියෝ කැමරා එකකුයි.... අපේ වයිෆ්ට හොඳ අත්-ඔර්ලෝසුවකුයි ගෙනැත් දෙනවා.....

## බෝලය ඇළට විසිකිරීම

දඩබ්බරකම්කර අසුවූ කුඩා ළමයින් තිදෙනෙක් විදුහල්පතිවරයා වෙත පමුණුවන ලදී.

" මොනවද ඔය ළමයා කරපු වැරදි වැඩ....? " විදුහල්පති පළමුවැනි ළමයාගෙන් ඇසුවේ ය.

" සර් මං අල්ලපු වත්තෙ අඹ කැඩුවා..... පාරෙ වීදුරු කටු දැම්මා..... ඊට පස්සෙ බෝලෙ ඇළට විසි කළා...."

" හොඳයි ඔය ළමයා....? " විදුහල්පති දෙවැන්නාගෙන් ඇසුවේ ය.

" සර් මම අල්ලපු වත්තෙ අඹ කැඩුවා පාරට වීදුරු කටු දැම්මා.....බෝලෙ ඇළට විසි කළා........"

" ඔය ළමයා මොනවද කළේ? " විදුහල්පති තුන්වැන්නාගෙන්ද ඇසී ය.

" සර් මමත් අල්ලපු වත්තෙ ගහේ අඹ කැඩුවා.. වීදුරු කටු අරන් පාරට විසි කළා......."

" ඇයි ඔය ළමයා බෝලෙ ඇළට විසි කළේ නැද්ද..... ? "

" නෑ සර්...... මම නේ බෝලෙ......"

*ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.*

***ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 15 ක චෙක්පතක් Lanka Viththi යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.***

**Lanka Viththi**
**P. O. Box 64678,**
**London NW3 9LS**

## තාත්තගෙ රැකියාව

දෙක වසර පන්තියට අළුතින් පත්ව ආ ගුරුතුමිය ළමයින් හඳුනාගැනීම සඳහා තම තමන්ගේ තාත්තලා කරන රස්සාවල් ගැන විමසුවාය. එක්වරම උඩ පැන අත ඉස්සූ ළමයෙක් " ටීචර් අපේ තාත්තා ඩොක්ටර් කෙනෙක්..... " යයි කීවේ ය.

දෙවන ළමයා ද ගත් කටටම කියා සිටියේ " ටීචර්..... අපේ තාත්තත් ඩොක්ටර් කෙනෙක්..... " කියා ය.

තුන්වන ළමයා වූයේ අප කවුරුත් හොඳින් හඳුනන ඇම්ඩන් ය. ගුරුතුමියගේ ප්‍රශ්නයට පිළිතුරුදෙමින් ඇම්ඩන් මෙසේ කීවේ ය.

" ටීචර් අපේ තාත්තා කරන්නේ දොස්තරලට කරන්න බැරිවෙච්ච වැඩ කටයුතු තමයි "

" බොහොම හොඳයි...... ඒ කියන්නෙ ඔය ළමයගෙ තාත්තා විශේෂඥ දොස්තර කෙනෙක් ? එහෙම නේද...? " ගුරුතුමිය ඇසුවා ය.

එයට ඇම්ඩන් මෙසේ පිළිතුරු දුන්නේ ය.

" එහෙම කිව්වත් ඉතිං වරදක් නෑ ටීචර්.... අපේ තාත්තට මිනීපෙට්ටි සාප්පුවක් තියනවා...... "

## විවාහවන අය

දවසක් තාත්තා කෙනෙක් තමාගේ පුතාත් සමග ගමනක් යමින් සිටියේය. ගමන අතර මග ගසක් යට සිටි බූරුවන් දෙදෙනෙකු දුටු පුත්‍රයා තාත්තා ගෙන් මෙසේ අසන්නට වීය.

**පුතා:** තාත්තෙ අර කවුද ...?

**තාත්තා:** ඒ පුතේ බූරුවෙක්....!

**පුතා:** එතකොට අර එහා පැත්තෙ ඉන්නෙ.....?

**තාත්තා:** ආ ඒ පුතේ බූරුවගෙ වයිෆ්....!

**පුතා:** ඒ කියන්නෙ තාත්තෙ බූරුවොත් කසාද බඳිනවද....?

**තාත්තා:** අපොයි ඔව් පුතේ, කසාද බඳින තරමක් බඳින්නෙ බූරුවොම තමයි.



## පූසා

***මේ කථාව අපට ලැබී දැන් සෑහෙන කාලයකි. මෙය පළකිරීම ප්‍රමාද වූයේ කතාවේ එන පූසාගේ පින්තූරය ලැබෙන තුරුය.***

අළුත බැඳපු ජෝඩුවකි. ඔව්හු සතුටින් ජීවත් වූහ. එහෙත් ටික කලකින් ගෙදර රණ්ඩු සරුවල් ඇති වෙන්නට පටන් ගත්තේ බිරිඳ පූසෙකු ගෙනැත් ඇතිකරන්නට පටන්ගත් පසුවය. බිරිඳ පූසාට මිස තමාට දැන් වැඩි ආදරයක් නැති බව දුටු සැමියා පූසා කෙරෙහි දැඩි තරහක් ඇතිකරගත්තේය. දැන් ඔහුගේ ප්ලෑන් එක කෙසේ හෝ පූසා ගෙදරින් එළවා දැමීමයි. එහෙත් කොතරම් උත්සාහ කළද පූසා ගෙදරින් එළවා දැමීම පහසු කටයුත්තක් වූයේ නැත. ඔහු පූසාට තරවටු කළේය. කන්න බොන්න නොදී සිටියේය. හංදියට ගෙන ගොස් අතරමං කර ආවේය. එහෙත් මේ කිසිවකින් පලක් නොවීය. පූසා ආපසු ගෙදර ආවේය. බිරිඳ මේ කිසිවක් දන්නේ නැත. ඇය ඌට හොඳින් කෑම දී සංග්‍රහ කළා ය.

බැරිම තැන පූසාට වැඩක් දෙන්නට සිතූ සැමියා පූසාවත් කාර් එකේ දාගෙන අටකලම්පන්නේ මහ ඝන කැලෑවකට ගොස් පූසාව කැලෑවේ අතරමං කළේ වෙන වතාවල මෙන් නොව මේවර නම් කොයි විදියකින් හෝ පාර සොයාගැනීමට බැරිවන විදියට ය. පූසාද කැලෑවේ නොපෙනී ගියේ ය. ඔහුගේ හිතට දැන් සහනයක් දැනිණ.

ටිකෙන් ටික රෑබෝවන්නට විය. ඔහුට දැනුණේ තමා දැන් කැලෑවේ අතරමං වී ඇති බව ය. ඒ මහා ඝණ කැලෑවෙන් එළියට ඒමට නොහැකිව ඔහු ඒ මේ අත ඇවිද්දේ ය. අන්තිමේදී කෙසේ හෝ යාන්තම් කැලෑවෙන් එළියට පැමිණි ඔහු කාර් එක ළඟට ආවේ ය. එහෙත් ආපසු ගෙදර යන පාර ඔහුට අමතක ය. එතැන පාරවල් කීපයක් ම වීය. පාරේ මිනිස් පුළුටක් පෙනෙන්නට ද නැත. දැඩි ලෙස බියට පත් වූ ඔහුට ඇඬෙන්නට ආවේ ය.

එවිටම ඔහුගේ මොබයිල් පෝන් එක නාද විය. අනික් පැත්තේ කතා කළේ බිරිඳ ය. ඇය මෙසේ කීවා ය.

" ඔයා මොනවද අනේ කරන්නෙ? රෑවේගනත් එනවා.... ගෙදර එන්නෙ නැද්ද.....? මේ පූසත් ඇවිල්ල ඉන්නෙ..... "

එය ඇසීමෙන් තරු විසිවූ ඔහු බිරිඳට වහා මෙසේ කීවේ ය.

" අම්මට උඩු පූසා ඇවිල්ලද....? මේ එහෙනං අනේ පූසට පොඩ්ඩක් පෝන් එක දෙනවද...? මට ගෙදර එන්න පාර හොයාගන්න බැරුවයි මේ ඉන්නෙ...."

♦ *නන්දන බොරලැස්ස* Sri Lanka

**SHANTHI & CO** ❋❋❋❋❋
**Solicitors & Commissioners for Oaths**

**We are an established law firm in North London**
Specialising in Immigration matters (Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)
♦ Residential / Commercial Conveyancing
♦ Landlord and Tenant Disputes ♦ Divorce ♦ Employment Law
♦ General Litigation (Sale of Goods, Services, Debts etc.)
♦ We offer comprehensive services on legal maters in Sri Lanka
***Contact*:- Shanthi Senadheera (*Solicitor*) Padmini Senadheera (*Solicitor*) Dinu Senadheera (*Solicitor*)**
**206 Seven Sisters Road, Finsbury Park, London N43NX**
**Tel. 020 7561 9494 Fax 020 7561 9495**
**Emergency: 07956 129 642 shanthi.co@btconnect.com**